# දැන්වීමයි

## මැතිවරණ කොමිෂන් සභාව

### 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(4)(අ) වගන්තිය යටතේ දැන්වීම

01. 2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනතෙන් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ අංක 7(4)(අ) වගන්තිය අනුව මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීම සඳහා වූ අයදුම්පත් 2025.02.28 වන දින සිට 2025.03.28 වන දින ප.ව.3.00 දක්වා භාර ගනු ලැබේ. අදාළ අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අදාළ පක්ෂයේ ලේකම්වරයා පෞද්ගලිකව පැමිණ මැතිවරණ කොමිෂන් සභාව වෙත භාර දීම හෝ කළ හැකිය. එම අයදුම්පත් යොමු කිරීමේ දී ලිපිකවරයේ ඉහළ වම්පස "දේශපාලන පක්ෂ පිළිගැනීම වෙනුවෙන් අයදුම් පත්‍රය - 2025" යනුවෙන් සඳහන් කළ යුතු වේ. ලියාපදිංචි තැපෑලෙන් එවනු ලබන අයදුම්පත් සභාපති, මැතිවරණ කොමිෂන් සභාව, සරණ මාවත, රාජගිරිය (10107) යන ලිපිනයට යොමු කළ යුතු වේ.

02. අයදුම්පත් භාරගන්නා අවසන් දිනයෙහි නියමිත වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා කරනු නොලැබේ.

03. දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීම සඳහා ඉල්ලුම් කරනු ලබන අයදුම්පත, පක්ෂයේ ලේකම්වරයා විසින් අත්සන් කරනු ලැබ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

04. අයදුම්පත්‍රය, මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.elections.gov.lk) මගින් බාගත කර ගත හැකි අතර, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මගින් හා මැතිවරණ මහලේකම් කාර්යාලයෙන් ද අදාළ අයදුම්පත ලබා ගත හැකි වේ.

05. පක්ෂය පිළිගනු ලැබුවහොත් එම පක්ෂය සඳහා වෙන් කරගනු ලැබීමට අපේක්ෂා කරනු ලබන්නේ අංක 2404/64 හා 2024.10.04 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ සඳහන් අනුමත කරන ලද (ආ) උපලේඛනයේ සඳහන් ලකුණු අතුරින් කවර ලකුණක් ද යන්න එම ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් කළ යුතු ය.

06. අයදුම් පත්‍රය සමඟ පහත සඳහන් ලේඛන වල සහතික කළ ඡායා පිටපත් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. අවශ්‍ය වුවහොත් මුල් පිටපත් පරීක්ෂා කර බලනු ඇත.

   I. පක්ෂ ව්‍යවස්ථාව
   II. පක්ෂයේ නිලධාරී මණ්ඩලයේ ලැයිස්තුව (පක්ෂයේ නිලධාරී මණ්ඩලයට අවම වශයෙන් එක් කාන්තාවක් හෝ ඇතුළත් කිරීමට වග බලා ගත යුතු ය.)
   III. පක්ෂයේ විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශ (අයදුම්පත ඉදිරිපත් කරන දිනට ආසන්නතම වූ වසර හතරක)
   IV. පක්ෂයේ තත්කාලීන ප්‍රතිපත්ති ප්‍රකාශය
   V. දේශපාලන පක්ෂයක් වශයෙන් ආසන්නතම වූ වසර හතරකවත් කාලය තුළ අඛණ්ඩව ක්‍රියාත්මක වූ බව සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි සියලුම ලිපිලේඛන හා ඒ පිළිබඳ වාර්තාවක්

07. පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීමට කෙරෙන ඉල්ලීමක් සම්බන්ධයෙන් 2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනතෙන් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(5) ,(6) හා (7) යන නියමයන් තීරණාත්මක හා අවසානාත්මක වේ.

08. ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේ දී අංක 2263/23 හා 2022.01.21 දිනැති දේශපාලන පක්ෂ ලියාපදිංචිය සම්බන්ධ ගැසට් පත්‍රයේ සඳහන් නිර්ණායක අනුව කටයුතු කර ඇති බව සනාථ කළ යුතුවේ.

ආර්.එම්.ඒ.එල්. රත්නායක
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව

මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත, රාජගිරිය (10107)
2025 පෙබරවාරි මස 28 දින

සටහන - මේ පිළිබඳව 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ විධිවිධාන පරිශීලනය කිරීම යෙහෙකි.